ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2003 අංක 28 දරන රබර් පර්යේෂණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 සැප්තැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 සැප්තැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2003 අංක 28 දරන රබර් පර්යේෂණ**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2003 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.–ඕ. 35/2000.

**රබර් පර්යේෂණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2003 අංක 28 දරන රබර් පර්යේෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 39 දරන පනතින් අවසන් වරට සංශෝධිත රබර් පර්යේෂණ ආඥාපනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :– 439 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1) මණ්ඩලය –

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන් එනම් :–

(i) රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ;

(ii) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ;

(iii) ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ සභාපතිවරයා ලෙස තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ; සහ

2—H 018074—4,500 (2003/05)

(ආ) පහත සඳහන් නම් කළ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය :–

(i) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන් ;

(ii) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු ගෙන් ;

(iii) වැවිලි සමාගම් නියෝජනය කරන තැනැත්තන් අතරින් ලංකා වැවිලිකරුවන්ගේ සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(iv) කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රයේ විශිෂ්ටතාවක් දක්වා ඇති තැනැත්තන් අතරින් කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් නම් කරනු ලබන තැනැත්තකුගෙන් ;

(v) කුඩා රබර් වතු හිමියන් නියෝජනය කරන තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනකුගෙන් ;

(vi) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන කොළඹ රබර් වෙළෙඳුන්ගේ සංගමයේ නියෝජිතයකුගෙන් ;

(vii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන රබර් නිෂ්පාදකයන්ගේ සංගමයේ නියෝජිතයකුගෙන් ;

(viii) වැවිලි කාර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තකුගෙන් ;

(ix) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෘත්තීය සමිති නියෝජනය කරන සාමාජිකයන් දෙදෙනකුගෙන් ;

මේ ඡේදයේ කාර්ය සඳහා "වෘත්තීය සමිතියක්" යන්නට (138 වන අධිකාරය වන) වෘත්තීය සමිති ආඥා පනතේ එයට දී ඇති අර්ථයම ඇත්තේ ය.".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "පත් කළ සාමාජිකයකු" යන වචන වෙනුවට "නම් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(3) රෝගාතුරවීම, අබලතාව හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොටගෙන නම් කළ සාමාජිකයකුට ස්වකීය කාර්යය ඉටුකිරීමට තාවකාලික වශයෙන් නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, එම කාලය තුළ, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය." ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙහි "පත්කළ සාමාජිකයකු" යන වචන වෙනුවට, "නම් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "පත්කළ සාමාජිකයකු" යන වචන වෙනුවට, "නම් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(6) මරණය, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ වෙනත් හේතුවක් නිසා, මණ්ඩලයේ යම් නම් කළ සාමාජිකයකු විසින් ධුරය අත්හරිනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයා වෙනුවෙන් අනුප්‍රාප්තවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එවැනි නම් කළ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.";

(7) ඒ වගන්තියේ (9) වන උපවගන්තියෙහි "පත්කළ සාමාජිකයකු" යන වචන වෙනුවට, "නම් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන්. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ වගන්තිය සංශෝධනය කිරීම.

**3.** 1987 අංක 39 දරන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරන ලද 3අ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(1) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලය විය යුතු ය :

එසේ වුව ද, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස වූ ධුර කාලය ඉකුත්වීමට පෙර, සභාපතිවරයා ලෙස ධුරය දැරීම අවසන් කරනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය හැකි අතර, එම සාමාජිකයා විසින් ඔහු සභාපතිවරයා ලෙස කලින් ධුරය අත්හරින්නේ නම් මිස තමා අනුප්‍රාප්ත වන්නේ යම් සභාපතිවරයකු

සඳහා ද, එම සභාපතිවරයාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා සභාපතිවරයා ලෙස සේවය කරනු ලැබිය යුතු ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන් වුව ද, මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුරය දරන්නා වූ සෑම තැනැත්තකු ම, ඒ තැනැත්තා ප්‍රධාන ප්‍රඥප්තියේ (3) වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඒ ධුරය දරන්නේ වුව ද මේ පනත ආරම්භ වන දින ධුරය දැරීම අවසාන විය යුතු ය.

මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දින ධුරය දරන්නා වූ මණ්ඩලයේ සාමාජිකයන් මේ පනත ආරම්භ වන දින එම ධුරය දැරීම අවසාන විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.